වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

Annual Report

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

தேசிய கல்வி ஆணைக்குழு

National Education Commission

2020

නො. 126, නාවල පාර, නුගේගොඩ - 126 எனும், முகவரியில் அமைந்துள்ளது - No.126, Nawala Road, Nugegoda.

වාර්ෂික වාර්තාව 2020

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

වැය ශිර්ෂය 335

සභාපතිතුමාගේ පණිවුඩය

වර්ෂ 2020 මාර්තු මස රාජකාරි ආරම්භ කළ 8 වන ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් මෙම පණිවුඩය ඉතා සතුටින් ඉදිරිපත් කරමි.

එවක පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන්, කොමිෂන් සභාවේ කටයුතු ආරම්භ කිරීමට සිදු වූයේ 2020 ජූනි මස අග භාගය වනවිට දීය. අභාග්‍යසම්පන්න ලෙස 2020 ඔක්තෝබර් මස අග භාගයේ දී නැවතත් රාජකාරි කටයුතු සඳහා කොවිඩ් වසංගතය බාධාවක් විය. එකී බාධාවන් මධ්‍යයේ, අධ්‍යාපන ක්ෂේත්‍රය පුළුල් කිරීමේ හා වෙනස්කම් සිදුකිරීමේ අවශ්‍යතාවය අනුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව තුළ ප්‍රතිසංස්කරණ සිදු කිරීම හා ශක්තිමත් කිරීම සඳහා ක්‍රමානුකූල ක්‍රියාමාර්ග ගැනීමට නව කොමිෂන් සභාව සමත් විය.

අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ක්‍රියාකරන වැදගත් සහ අග්‍ර ආයතනයක් වශයෙන්, විශේෂයෙන්ම අනෙකුත් අධ්‍යාපනය හා බැඳුණු ආයතන විසින් ඉටු නොකරනු ලබන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නව කොමිෂන් සභාව මනා අවබෝධයකින් යුතුව කටයුතු කෙරේ.

මෙවැනි සන්දර්භයක් තුළ, ජාතික ඉගෙනුම් නිපුණතා රාමුව (එනම්, ජාතික අධ්‍යාපන අරමුණු, මූලික නිපුණතා හා අධ්‍යාපනයේ විවිධ මට්ටම් සඳහා ඉගෙනුම්ඵල) සහ ජාතික අධ්‍යාපන ප්‍රමිති හා මාර්ගෝපදේශ නිශ්චය කිරීම හා යාවත්කාලීන කිරීම සහ එම ජාතික ඉගෙනුම් නිපුණතා රාමුව හා ජාතික අධ්‍යාපන ප්‍රමිති හා මාර්ගෝපදේශවලට අධ්‍යාපන ආයතන හා වැඩසටහන් අනුකූල වන්නේදැයි සමාලෝචනය කිරීම සඳහා ජාතික ආයතනයක අවශ්‍යතාවය පැන නැගේ.

එමනිසා, එම කාර්යය ඉටු කරලීම සඳහා නව කොමිෂන් සභාව ප්‍රගතිශීලී ප්‍රතිසංස්කරණ කිහිපයක් ක්‍රියාවට නංවා ඇති අතර 2020-2025 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ උපායමාර්ගික සැලැස්ම පිළියෙල කිරීම හා එය ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම එහි පළමු පියවර ලෙස සැළකිය හැකිය. කොමිෂන් සභාවේ දැක්ම හා මෙහෙවර අනුව, බහුවිධ කාර්යයන් ඉටුකිරීමට හැකිවන පරිදි අධ්‍යාපන ක්ෂේත්‍රයේ අග්‍ර ආයතනයක් වශයෙන් එකී කටයුතු නැවත ස්ථානගත කළ යුතු බව මම තරයේ විශ්වාස කරමි.

මහාචාර්ය හරිස්චන්ද්‍ර අබේගුණවර්ධන
සභාපති
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හි 2.4.1. ඡේදයට අනුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලදී.

2022 දෙසැම්බර්

පටුන

පරිච්ඡේදය **01** - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය	**01-05**
පරිච්ඡේදය **02** - ප්‍රගතිය හා ඉදිරි දැක්ම	**06-10**
පරිච්ඡේදය **03** - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	**11-26**
පරිච්ඡේදය **04** - කාර්ය සාධන දර්ශක	**27**
පරිච්ඡේදය **05**- තිරසාර සංවර්ධන අරමුණු **(SDG)** සපුරා ගැනීමේ කාර්ය සාධනය	**28**
පරිච්ඡේදය **06** - මානව සම්පත් පැතිකඩ	**29**
පරිච්ඡේදය **07**- අනුකූලතා වාර්තාව	**30-34**

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

1991 අංක 19 දරණ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත මගින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ස්ථාපිත කරන ලද්දේ අධ්‍යාපන ප්‍රතිපත්ති සහ සැලසුම් සමාලෝචනය කිරීම සහ පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ද ඇතුළුව අධ්‍යාපන ප්‍රතිපත්ති නොකඩවා පවත්වාගෙන යාම සහතික කිරීම සහ සමාජයේ වෙනස්වන අවශ්‍යතාවන්ට අධ්‍යාපන ක්‍රමය අනුකූලතාව දැක්වීමේ අදහස ඇතිව අධ්‍යාපන ප්‍රතිපත්තියේ සියලු අංශ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමේ අභිලාෂයෙනි.

තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ 4 වන පරිච්ඡේදය ප්‍රකාරව අධ්‍යාපන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් පොදු එකගතාවක් ලැබීම අරමුණු කෙරෙන "අධ්‍යාපන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ජාතික කොමිසමක්" පිහිටුවීමේ දැඩි අවශ්‍යතාව පිළිගෙන ඇත. "එබඳු කොමිසමක් මගින් වහාම දස අවුරුදු සැලැස්මක් පිළියෙල කිරීමේ කාර්යය ආරම්භ කළ යුතු අතර 1991 වසර තුළ එම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කටයුතු ඇරඹිය යුතුය" යන තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ සඳහන් ඉහත කරුණු පාදක කරගෙන හා වරින් වර ඇතිවන දේශපාලන වෙනස්කම් නිසා කෙරෙන බලපෑම් වලින් බැහැර වූ අධ්‍යාපන ක්‍රමයක් සඳහා ස්ථිර හා නිශ්චිත ප්‍රතිපත්තියක් සකස් කිරීමේ වැදගත්කම හඳුනාගෙන ඒ සඳහා 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත යටතේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පිහිටුවා තිබුණි.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 2(1) වන වගන්තිය සහ 2 (3) වන වගන්තිය ප්‍රකාරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ජනාධිපතිවරයාට ඉදිරිපත් කරන නිර්දේශ ඇතුළත් වාර්තාව පාදක කරගෙන අධ්‍යාපනයේ සියලු අංශ සම්බන්ධයෙන් වගකිවයුතු සියලු අධිකාරි හා ආයතන විසින් අනුකූලතාවක් දැක්විය යුතු ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ජනාධිපතිවරයා විසින් කලින් කල ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතුය.

කොමිෂන් සභා පනතේ 4 (1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ සංයුතියට අධ්‍යාපනය, පරිපාලනය, කළමනාකරණය යන ක්ෂේත්‍රවල හැකියාවක් ඇති තැනැත්තන් 10 දෙනෙකු සහ නිල බලයෙන් පත්වන සාමාජිකයන් 05 දෙනෙකු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන අතර පනතේ 5 වන වගන්තිය යටතේ පත් කරනු ලබන පූර්ණ කාලීන සභාපතිවරයා සහ උප සභාපතිවරුන් දෙදෙනකුන්ගෙන් ද කොමිෂන් සභාව සමන්විත වේ.

වර්තමානයේ ක්‍රියාත්මක වන්නේ 8වැනි කොමිෂන් සභාවයි. (2020 .02.28 දින සිට)

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා ප්‍රධාන කාර්යයන්

දැක්ම

දේශීය හා ගෝලීය අභියෝගවලට මුහුණ දීමට අනුගත වූ සාමකාමී, එකමුතු ශ්‍රී ලාංකීය සමාජයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රගතිශීලීව සහ ජීවිත කාලය පුරාම අධ්‍යාපනය ලබන්නාවූ සමාජයක්

මෙහෙවර

අධ්‍යාපනයේ ගුණාත්මකභාවය, අදාළත්වය සහ අධ්‍යාපනයේ ප්‍රමිතීන් වැඩිදියුණු කිරීමේ අදහසින් අධීක්ෂණ සහ සහතික කිරීමේ භූමිකාවන් සමඟ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති, ඉලක්ක, නිපුණතා පැතිකඩ සහ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ ප්‍රමිතීන් සැකසීමේ ප්‍රමුඛතම සංවිධානය ලෙස ක්‍රියා කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

(අ) අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලසුම් වහා සමාලෝචනය කිරීම සහ පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ද ඇතුළුව, අධ්‍යාපන ප්‍රතිපත්ති නොකඩවා පවත්වා ගෙන යාම සහතික කිරීමේ සහ සමාජයේ වෙනස්වන අවශ්‍යතාවන්ට අධ්‍යාපන ක්‍රමය අනුකූලවීම පිණිස, අධ්‍යාපන ප්‍රතිපත්තියේ සියලුම අංශ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ආ) ක්‍රියාත්මක වෙමින් පවතින ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලැස්ම හෝ සැලසුම් කලින් කල සමාලෝචනය කිරීම සහ විශ්ලේෂණය කිරීම ද අවශ්‍ය විටෙක එම ප්‍රතිපත්තියේ, සැලැස්මේ හෝ සැලසුම්වල ඇති කළ යුතු වෙනස්කම් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම;

(ඇ) කොමිෂන් සභාවේ උපදෙස් සඳහා ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය හැකි, අධ්‍යාපනයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත උපදෙස් දීම.

1.4 සංවිධාන සටහන

Organizational Structure of National Education Commission



කොමිෂන් සභාවේ සාමාජිකයින්

මහාචාර්ය එච්. අබේගුණවර්ධන
සභාපති

පද්මිණී රණවීර මිය
උප සභාපති (ප්‍රතිපත්ති)

කිංස්ලි ප්‍රනාන්දු මහතා
උප සභාපති (සැලසුම්)

නිල බලයෙන් පත්වුණු සාමාජිකයින්

මහාචාර්ය සම්පත් අමරතුංග
සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

බී.කේ.යූ. වික්‍රමසිංහ මහතා
සභාපති, තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

මහාචාර්ය කපිල සී.කේ. පෙරේරා
ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය

ටී.එම්.ජේ. බණ්ඩාර මහතා
අධ්‍යක්ෂ, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය

එම්.එම්. නයිමුඩීන් මහතා
අතිරේක ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

අනෙකුත් සාමාජිකයින්

ආචාර්ය ටී.ඒ. පියසිරි මහතා
හිටපු උපකුලපති,
වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

ආචාර්ය කපිල බණ්ඩාර මහතා
පීඨාධිපති, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

වෛද්‍ය අනුරුද්ධ පාදෙණිය මහතා
ළමා ස්නායු විශේෂඥ වෛද්‍ය,
රිජ්වේ ආර්යා ළමා රෝහල

ආචාර්ය ඉන්ද්‍රාණි තලගල මිය
හිටපු අංශ ප්‍රධානී,
මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපනය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ඩී.එම්.ඒ.ආර්.බී. දිසානායක මහතා
ලේකම්, උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යාංශය

ආචාර්ය හර්ෂ අලස් මහතා
සභාපති, ගේට්වේ ජාත්‍යන්තර පාසල

ස්වාමිනාදන් විමල් මහතා
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
වාග් විද්‍යාව සහ ඉංග්‍රීසි දෙපාර්තමේන්තුව,
යාපනය විශ්වවිද්‍යාලය

පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ හා ළගා කරගත් ප්‍රගතිය, අභියෝග හා ඉදිරි ඉලක්ක

හැඳින්වීම

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

1. පවත්නා වැඩසටහන් සමාලෝචනය හා විශ්ලේෂණය තුළින් රටේ අධ්‍යාපන ප්‍රතිපත්ති ඇගයීම.
2. වර්තමාන අවශ්‍යතා අනුව අධ්‍යාපනික ප්‍රතිපත්ති යෝජනා යාවත්කාලීන කිරීම.
3. පවතින ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් සම්බන්ධව සිදුකරන සමාලෝචන, විශ්ලේෂණ, තක්සේරු කිරීම් හා නවීකරණය මත පදනම්ව ජනාධිපතිතුමා වෙත අධ්‍යාපන ප්‍රතිපත්ති පිළිබඳව නිර්දේශ ලබාදීම.

ඉහත කාර්යයන් ඉටු කිරීම සඳහා පහත සඳහන් පරිදි ක්ෂේත්‍ර හතරක් යටතේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ස්ථාවර කමිටු හතරක් ස්ථාපිත කර ඇත.

1. සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව.
2. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුව.
3. උසස් අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව.
4. තාක්ෂණ හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව.



සෑම ස්ථාවර කමිටුවක්ම රාජ්‍ය හා පෞද්ගලික අංශයේ අදාළ ක්ෂේත්‍ර නියෝජනය කරන විද්වතුන් 15ක් 20 අතර සාමාජිකයින් පිරිසකගෙන් සමන්විත වේ.

2020 වර්ෂය සඳහා සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් වල කාර්යසාධනය පහත පරිදි සාරාංශ ගත කළ හැකිය.

සාමාන්‍ය අධ්‍යාපනය

– **පාසල් වර්ගීකරණය පිළිබඳ ප්‍රතිපත්ති සමාලෝචනය**

වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක පහත සඳහන් පාසල් වර්ගීකරණය පහත පරිදි වේ.

- 1AB - උසස් පෙළ විද්‍යා විෂයයන් ද ඉගැන්වීම සිදුකෙරෙන පාසල්
- 1C - උසස් පෙළ කලා හා වාණිජ විෂයයන් පමණක් ඉගැන්වීම සිදුකෙරන පාසල්
- Type 3 – 1 වසර සිට 5 වසර දක්වා පන්ති පමණක් ඇති පාසල්
- Type 2 - 1 වසර සිට 9 වසර දක්වා පන්ති පමණක් ඇති පාසල්

උක්ත පාසල් වර්ගීකරණය සම්බන්ධව සබරගමු පළාත් පාසල් කේන්ද්‍ර කරගනිමින් 2019 වර්ෂයේ සිදුකරන ලද සමීක්ෂණ වාර්තාව කොමිෂන් සභාවේ සාමාජිකයින් වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව ලබාගත් අදහස් හා යෝජනා

ඇතුළත් කරමින් අවසන් වාර්තාව යාවත්කාලීන කරන ලදී. එම අවසන් වාර්තාව සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරයාට ඉදිරිපත් ඇති අතර පැවති කෝවිඩ් වසංගත වාතාවරණ තත්ත්වය හමුවේ සැලසුම් කළ ආකාරයට සබරගමුව පළාත් අධ්‍යාපන බලධාරීන් සමග එම වාර්තාව පිළබඳව සාකච්ඡා කිරීමට නොහැකිවිය.

වාර්තාව මගින් ඉදිරිපත් කරන යෝජනා/නිර්දේශ

1. පාසල් සිතියම්කරණය තාර්කික විය යුතු අතර ප්‍රාථමික සහ ද්විතීයික පාසල් වැනි පාසල් වර්ග දෙකක් පමණක් ස්ථාපිත කළ යුතුය.
    - 1-5 ශ්‍රේණි පමණක් සහිත ප්‍රාථමික පාසල්
    - 6-13 ශ්‍රේණි දක්වා ඇති ද්විතීයික පාසල්
2. පාසල්වලට සිසුන් ඇතුළත් කිරීම ළඟම ඇති නිවෙස්වලට සීමා කළ යුතුය.
3. 30*30 පිරිවිතරයන්ට අනුව පන්ති කාමර සැලසුම් කළ යුතුය.
4. ද්විතියික පාසල් සඳහා අවශ්‍යතාව අනුව නේවාසිකාගාර පහසුකම් ලබාදීමට යෝජනා කිරීම.
5. ජාත්‍යන්තර සහ පෞද්ගලික පාසල් සහ පිරිවෙන් ප්‍රමිතීන් අනුව වර්ගීකරණය කර අන්තර්ජාලය හරහා ලියාපදිංචි කළ යුතුය.
6. දරුවා දිනපතා පාසලට පැමිණීමට යොමුවන පරිදි විවිධ ආකාරයේ සුභ සාධන වැඩසටහන් පැවැත්විය යුතුය (නිල ඇඳුම් ලබා දීම, ආහාර සැපයීම ආදිය)
7. සියලුම පාසල්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා විදුහල්පතිවරුන්, ගුරුවරුන් සහ අනෙකුත් නිලධාරීන් සඳහා වසර පහෙන් පහට ස්ථාන මාරුවීම් සිදු කළ යුතුය.
8. පාසලක සිටින ශිෂ්‍ය සංඛ්‍යාව කළමනාකරණය කළ හැකි විය යුතුය (උපරිම සිසුන් 1500).
9. දරිද්‍රතාව, පාසලේ සිට නිවසට ඇති දුරස්ථභාවය, අඩු මාපිය රැකවරණය වැනි සමාජ ප්‍රශ්න නිසා විපතට පත් වූ පාසල් හැර යන දරුවන් සඳහා අවශ්‍ය පරිදි ද්විතියික පාසල් සඳහා නේවාසිකාගාර පහසුකම් සැපයීම.

– **පාසල් පාදක වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම.**

2016 වර්ෂයේ දී සම්පාදනය කරන ලද සාමාන්‍ය අධ්‍යාපනයට අදාළ ප්‍රතිපත්ති මාලාවේ අන්තර්ගතව ඇති පාසල් වෘත්තීය මාර්ගෝපදේශනයට අදාළ පරිච්ඡේදය නැවත සමාලෝචනය කිරීම මෙහි අරමුණ විය. පාසල්වල විදුහල්පතිවරුන්, වෘත්තීය මාර්ගෝපදේශනයේ නියුතු ගුරුවරු, පාසල් ශිෂ්‍යයින්, වෘත්තීය මාර්ගෝපදේශනයට අදාළව කටයුතු කරනු ලබන රාජ්‍යය හා රාජ්‍ය නොවන ආයතනවල නිලධාරීන්, ව්‍යවසායකයින්, තරුණ සංවිධාන වැනි පාර්ශවයන් වෙතින් ලබා ගත් අදහස් හා යෝජනා අනුව **පාසල් පාදක වෘත්තීය මාර්ගෝපදේශනය සම්බන්ධ ප්‍රතිපත්ති යෝජනා කෙටුම්පත** සකස් කරන ලදි. එම කෙටුම්පත ඉදිරි සාකච්ඡා සඳහා යොමු කිරීමට අපේක්ෂා කළද පැවති කෝවිඩ් වසංගත වාතාවරණ තත්ත්වය හමුවේ සැලසුම් කළ ආකාරයට ඉදිරි කටයුතු සිදු කිරීමට නොහැකිවිය.

– **සාමාන්‍ය අධ්‍යාපනය තුළ STEM අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීමේ වත්මන් තත්ත්වය පිළිබඳ අධ්‍යයනය**

STEM යනු විද්‍යාව, තාක්ෂණය, ගණිතය සහ ඉංජිනේරු විද්‍යාව යන විෂයයන් පිළිබඳ අන්තර් විෂය ඉගෙනුම් ප්‍රවේශයක් වන අතර එහිදී අධ්‍යයන ඉගැන්වීම්-ඉගෙනීම සැබෑ ලෝකයේ උදාහරණ සමඟ ඒකාබද්ධ කර ඇත. මෙම පර්යේෂණය මගින් ශ්‍රී ලංකාවේ STEM අධ්‍යාපනයේ වත්මන් තත්ත්වය සහ එම ප්‍රවේශයේ ඉදිරි ගමන තවදුරටත් ප්‍රවර්ධනය කිරීම පිළිබඳ නිර්දේශයන් ඉදිරිපත් කිරීම අරමුණු කර ගෙන ඇත. මෙහිදී තවදුරටත් STEM අධ්‍යාපන ප්‍රවේශය පිළිබඳ ප්‍රධාන පාර්ශවකරුවන්ගේ දැනුවත්භාවය, භෞතික හා මානව සම්පත්, ඉගැන්වීම් ද්‍රව්‍ය සහ පාසල්වල පහසුකම් වැනි ප්‍රධාන අංග කිහිපයක් සම්බන්ධයෙන් තත්ත්වය පරීක්ෂා කර තක්සේරු කිරීමට ද අපේක්ෂිතය. පැවති කෝවිඩ් වසංගත වාතාවරණ තත්ත්වය හමුවේ 2020 වර්ෂය සඳහා සිදු කළ හැකිවූයේ මෙහි පර්යේෂණයෙහි අරමුණු හා ගැටලු හඳුනාගැනීම පමණි.

– **ගුරු වෘත්තීය සංවර්ධන ප්‍රතිපත්තිය නැවත ඇගයීම (2014 ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පර්යේෂණ අධ්‍යයනය සහ 2016 සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනාවට අදාළව)**

ලංකාවේ ගුරු වෘත්තිය නංවාලීම කෙරෙහි ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව නිරන්තර අවධානය යොමු කරමින් සිටී. ඒ අනුව, ගුරු වෘත්තීය සංවර්ධන සඳහා සුදුසු ප්‍රතිපත්තියක් සහ උපාය මාර්ගික මැදිහත්වීම් රාමුවක් සැලසුම් කිරීමේ අරමුණින්, **"ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපන ක්‍රමයේ වත්මන් තත්ත්වය: ගුරුවරුන්ගේ වෘත්තිකභාවය සඳහා වන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ භාවිතයන්"** නමින් වන අධ්‍යයනය ආරම්භ කරන ලදි. මෙහිදී ජාතික අවශ්‍යතා සහ ගෝලීය ප්‍රවණතාවලට අනුකූලව ගුරු වෘත්තීය සංවර්ධනය පිළිබඳ අඩුපාඩු ආමන්ත්‍රණය කිරීමට අපේක්ෂා කරන ලදි. පැවති කෝවිඩ් වසංගත වාතාවරණ තත්ත්වය හමුවේ 2020 වර්ෂය සඳහා සිදු කළ හැකිවූයේ මෙහි පර්යේෂණයෙහි අරමුණු හා ගැටලු හඳුනාගැනීම පමණි.

තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය

– **තාක්ෂණික, වෘත්තීය අධ්‍යාපනික හා පුහුණු (TVET) ආයතනවල NVQ 5 සහ 6 මට්ටම්වලට අදාළ ඩිප්ලෝමා වැඩසටහන්වල ක්‍රියාත්මකබව, ගුණාත්මකභාවය සහ අදාළත්වය තක්සේරු කිරීම පිළිබඳ අධ්‍යයනය.**

ජාතික වෘත්තීය සුදුසුකම් 5 සහ 6 මට්ටම්වල ඩිප්ලෝමා පාඨමාලා සැලසුම්ගත ආකාරයෙන් ක්‍රියාත්මක වේ දැයි, එම පාඨමාලා සඳහා වන සිසුන්ගේ ඉල්ලුම සහ සිසුන් විසින් එම පාඨමාලා සම්පූර්ණ කිරීමේ ප්‍රගතිය තහවුරු කර ගැනීමට බලාපොරොත්තු වේ; වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන තුළ අදාළ පාඨමාලා ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් ඇත්දැයි හඳුනාගැනීම; NVQ 5 සහ 6 ඩිප්ලෝමා පාඨමාලා ක්‍රියාත්මක කිරීම සුපරීක්ෂණය සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුන්වා දෙනු ලැබූ නියාමන යාන්ත්‍රණයේ ඵලදායීතාව හඳුනා ගැනීම මෙම අධ්‍යනයේ අරමුණු වේ.

තාක්ෂණික, වෘත්තීය අධ්‍යාපනික හා පුහුණු ආයතන විසින් පිරිනමනු ලබන පුහුණු වැඩසටහන් සම්බන්ධයෙන් වන ජාතික වෘත්තීය සුදුසුකම(NVQ) 5 වන මට්ටම අවසානයේ පද්ධතියෙන් ඉවත්වීමට හෝ වැඩිදුර අධ්‍යයන කටයුතු සඳහා ඉදිරියට යාමට සහ 6 වන මට්ටම අවසානයේ උසස් ඩිප්ලෝමාව ලබාගෙන පිටවයාමට අවසර ලබා දී තිබේ. NVQ 3/4 වැඩසටහන්වල සිට NVQ මට්ටමේ 5 වැඩසටහන් දක්වා සිසුන් සුමට ලෙස සංක්‍රමණය වීමට පහසුකම් සැලසීම සඳහා වත්මනෙහි පවතින හිඩැස් පිරවීමේ වැඩසටහන් හඳුන්වා දී ඇත. NVQ 5/6 වැඩසටහන හඳුන්වාදීමත් සමඟ අ.පො. ස (උසස් පෙළ) සුදුසුකම් සහිත සිසුන්ට ඒ සඳහා ඇතුළත්වීමට ඉඩකඩ සලසා දී ඇති අතර හිඩැස පිරවීමේ (Gap filling) වැඩසටහන් වල අදාළත්වය සමාලෝචනය කිරීම මෙමගින් අපේක්ෂිතය. තවදුරටත් NVQ 5/6 වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) හි නියාමන යාන්ත්‍රණවල සඵලතාවය තක්සේරු කිරීම සහ නොගැලපීම් තිබේද යන්න සහ අවශ්‍ය නම්, අඩුපාඩු නිවැරදි කිරීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හඳුනා ගැනීම ද මෙමගින් අපේක්ෂිතය. පැවති කෝවිඩ් වසංගත වාතාවරණ තත්ත්වය හමුවේ 2020 වර්ෂය සඳහා සිදු කළ හැකිවූයේ මෙහි පර්යේෂණ ගැටලුව හා අරමුණු හඳුනාගැනීම පමණකි.

තොරතුරු සහ දත්ත සමුදාය කළමනාකරණය

– **අධ්‍යාපනික දත්ත පදනම් කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීම සහ අධ්‍යාපනය සඳහා සවිස්තරාත්මක සංඛ්‍යානමය පදනමක් සංවර්ධනය කිරීම**

අධ්‍යාපනය හා බැඳුණු පාර්ශවකරුවන් විසින් තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී දත්ත රැස්කිරීම, සැකසීම, විශ්ලේෂණය කිරීමේ සංස්කෘතියක් පුහුණු කිරීම තුළින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියේ කළමනාකරණය, සැලසුම් කිරීම, අධීක්ෂණය වර්ධනය කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණයි.

ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා 2020.06.07 වැනි දින මාර්ගගත තාක්ෂණය ඔස්සේ අදාළ පාර්ශවයන් සමග මූලික සාකච්ඡාවක් ද සියලුම ස්ථාවර කමිටු වෙත යෝජනාව ඉදිරිපත් කර ඒ අනුව ලබාගත් අදහස් හා යෝජනා පිළිබද සාකච්ඡාවක් ද 2020.12.20 දින පවත්වන ලදි. මෙහිදී ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය පිළිබඳ සංඛ්‍යාන සංග්‍රහයක් (Statistical Digest on Education) සකස් කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කරන ලදී. යෝජිත අධ්‍යාපන සංඛ්‍යාලේඛන සංග්‍රහයේ මූලික අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රය ආවරණය වන පරිදි සංඛ්‍යානමය තොරතුරු සම්පාදනය කිරීමයි. ප්‍රතිපත්ති සම්පාදකයින්, සැලසුම්කරුවන්, පර්යේෂකයන් සහ වෙනත් පුද්ගලයින් සඳහා නිවැරදි තීරණ ගැනීමට භාවිතා කළ හැකි අධ්‍යාපන ක්‍රමයේ විවිධ උප අංශවල (උසස් අධ්‍යාපනය, සාමාන්‍ය අධ්‍යාපනය සහ තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපනය) ප්‍රවණතා සහ අනාවැකි මෙම සංග්‍රහය තුළ නිරූපණය කිරීමට නියමිත විය. පැවති කෝවිඩ් වසංගත වාතාවරණ තත්ත්වය හමුවේ 2020 වර්ෂය සඳහා සිදු කළ හැකිවූයේ ද්විතියික මූලාශ්‍ර දත්ත රැස් කිරීම පමණි.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ප්‍රලේඛන මධ්‍යස්ථානය/ පුස්තකාලය වැඩිදියුණු කිරීම

අධ්‍යාපනික පොත්, සඟරා, වාර්තා, පනත් සහ අනෙකුත් අධ්‍යාපන සම්බන්ධ ලේඛන එකතුව සහිත ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ප්‍රලේඛන මධ්‍යස්ථානය, විෂය ක්ෂේත්‍ර අනුව පරිශීලනයේ පහසුව සඳහා වැඩි දියුණු කර ඇත.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වෙබ් අඩවිය වැඩිදියුණු කිරීම

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සඳහා ආකර්ශනීය, ගතික වෙබ් අඩවියක් තැනීම මෙහි අරමුණයි. පැවැති වෙබ් අඩවිය පරිශීලක මිත්‍රශීලි (Customer Friendly) නොවූ නිසා පරිශීලකයින්ට ඔවුන්ට අවශ්‍ය දේ සොයා ගැනීමට සහ ආයතනය හා සම්බන්ධවීම පහසු වන පරිදි අන්තර්ගත කළමනාකරණ පද්ධතියක් (CMS) හඳුන්වා දී නව වැඩිදියුණු කිරීම් මගින් මෙහි කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට අපේක්ෂිතය.

“NEC News” ප්‍රවෘත්ති විවරණිකාව සම්පාදනය

වත්මන් අධ්‍යාපන ප්‍රතිපත්ති/ ප්‍රතිපත්ති සම්පාදනය සම්බන්ධ මූලික ප්‍රයත්නයන් පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සහ පවතින වර්තමාන තත්ත්වය පිළිබඳ මහජන සංවාදයක් ආරම්භ කිරීමේ අරමුණින් සම්පාදනය කළ “NEC News” නමින් 2020 සඳහා වූ ප්‍රවෘත්ති විවරණිකාව සාර්ථක ලෙස නිම කිරීමට හැකිවිය. අලුතින් පත්වූ 8වන ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති, උප සභාපතිවරුන්ගේ පණිවුඩ සමගින් සාමාජිකයින්ගේ සංයුතිය, කාර්යමණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම, නව කාර්යමණ්ඩලය බඳවා ගැනීම, ආයතනික ක්‍රියාවලීන් තුළ සිදුකළ වෙනස්කම්, ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (2020-2030) සකස් කිරීම, ජාතික ඉගෙනුම් නිපුණතා රාමුව (NLCF) සකස් කිරීම, ආයතනය විසින් 2020 වර්ෂය සඳහා සිදුකරනු ලැබූ පර්යේෂණ පිළිබඳව විස්තර මෙහි අන්තර්ගතය වේ.

ජාතික අධ්‍යාපන අරමුණු (NEGs) සකසා අවසන් කිරීම, ජාතික අධ්‍යාපන අරමුණු මත පදනම් වූ මූලික නිපුණතා (NEG-BCs) සංවර්ධනය කිරීම සහ ජාතික අධ්‍යාපන අරමුණු මත පදනම් වූ මූලික නිපුණතා ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ (SLQF) මට්ටම්වල විස්තර, එම මූලික නිපුණතා සමග සිතියම්ගත කිරීම.

සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය සඳහා දැක්ම ප්‍රකාශය සකස් කිරීම සහ අ.පො.ස.(සා.පෙළ) සහ අ.පො.ස.(උ.පෙළ) අනුරූපව ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ (SLQF) 1 සහ 2 මට්ටම් සඳහා විස්තර සකස් කිරීම මෙහි අරමුණු වේ. මේ සඳහා 2020 වර්ෂයේදී අදාළ පාර්ශ්වකාර විශේෂඥ කණ්ඩායම් සමග සාකච්ඡා වට පහක් පැවැත්විණි. මේ සඳහා දළ කෙටුම්පතක් සකසන ලද අතර එය 2021 වර්ෂයේදී අවසන් කිරීමට යෝජිත ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව ලේඛනයේ පළමු කොටස ලෙස සම්පාදනය කිරීමට සැලසුම් කොට ඇත.

2.2 පවත්නා අභියෝග

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මධ්‍ය කාලීන කාර්ය සාධන සංවර්ධන සැලැස්මට අනුව, සාමාන්‍ය අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය සහ එකී අධ්‍යානයන් සඳහා පහසුකම් සපයන ආයතනික හා පරිපාලනමය අභියෝග හා ඉදිරි ඉලක්ක පහත පරිදි වේ.

2.3 ඉදිරි ඉලක්ක

- ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පහසුකම් සහිත නව ස්ථානයක ස්ථාපිත කිරීම.

- ආයතනයේ නව සැලසුම් ඵලදායීව ක්‍රියාත්මක කරලීමට හැකි අධ්‍යයන කාර්ය මණ්ඩලයක් බඳවාගත හැකිවනු පිණිස හා බඳවාගත් නව නිලධාරීන් තවදුරටත් දිගුකාලයක් රඳවාගැනීමට හැකිවන පරිදි බඳවාගැනීමේ පටිපාටිය සංශෝධනය කරගැනීම හා අදාළ අනුමැතීන් ලබාගැනීම.

- දස අවුරුදු ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම හා අනුමැතිය ලබාගැනීම.

- ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනයක් ලෙස ස්ථාපනය කරගැනීම.

- ජාත්‍යන්තර පාසල් අධ්‍යාපනය හා මුල් ළමාවිය සංවර්ධන අධ්‍යයන සම්බන්ධයෙන් ප්‍රමිති නිශ්චය කිරීමට හැකි සහ එම ප්‍රමිතීන් නිසි පරිදි ක්‍රියාත්මක වන්නේදැයි සමාලෝචනය කිරීමට හැකිවන පරිදි ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවට බලය ලබාදෙමින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම හා ඊට අනුමැතිය ලබාගැනීම.

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 ශේෂ පත්‍රය (මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය)

ඒසීඒ-එෆ්

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2020		සටහන	සත්‍ය 2020	2019	
-	ආදායම් ලැබීම්				
-	ආදායම් බදු	1		-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2		-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3		-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	98,565	114,530	
-	මුළු ආදායම් ලැබීම් (අ)		98,565	114,530	
	ආදායම් නොවන ලැබීම්				
-	භාණ්ඩාගාර අග්‍රිම		38,774,000	44,345,000	ඒසීඒ-3
-	තැන්පතු		9,175	15,000	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		579,503	1,488,502	ඒසීඒ-5
-	වෙනත් ලැබීම්		369,537	656,996	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		39,732,215	46,505,498	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		39,830,780	46,620,028	
	අඩුකළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
26,200,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	20,928,243	23,460,843	ඒසීඒ-2(ii)
15,770,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	14,062,261	15,582,655	
763,000.00	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	3,124,710	762,736	
-	පොළී ගෙවීම්	8		-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9		-	
42,733,000	මුළු පුනරාවර්තන වියදම් (ඈ)		38,115,215	39,806,234	
	මූලධන වියදම්				
100,000	මූලධන වත්කම් ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම්	10		-	ඒසීඒ-2(ii)
1,150,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	181,144	585,275	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12		-	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13		-	
1,300,000	හැකියා වර්ධනය	14		209,300	
6,800,000	වෙනත් මූලධන වියදම්	15	938,438	3,759,310	
9,250,000	මුළු මූලධන වියදම් (ඉ)		1,119,582	4,553,885	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		110,725	1,011,975	
	තැන්පතු ගෙවීම්		6,725	31,975	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		104,000	980,000	ඒසීඒ-5
	මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)		39,345,521	45,372,094	
-	2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)		485,259	1,247,934	

1

3.2 - අදාළ නොවේ.

3.3 ආදායම් ප්‍රකාශය (මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය)

ඒසීඒ-8

2020 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	සතය 2020 රු.	2019 රු.
<u>මූල්‍ය නොවන වත්කම්</u>			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	45,156,061	44,974,918
<u>මූල්‍ය වත්කම්</u>			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	1,362,584	1,838,351
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	116,182	638,728
මුළු වත්කම්		**46,634,827**	**47,451,997**
<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>			
ශුද්ධ වත්කම්		1,330,134	1,808,351
දේපළ පිරියත හා උපකරණ සංචිතය		45,156,061	44,974,918
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
<u>ජංගම වගකීම්</u>			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	32,450	30,000
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	116,182	638,728
මුළු වගකීම්		**46,634,827**	**47,451,997**

පිටු අංක1.සිට 6 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 1. සිට 52 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම :
තනතුර :
දිනය :
ආචාර්ය එම්. උපාලි සේදර
රාජ්‍ය ලේකම්
අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා
දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
"ඉසුරුපාය" බත්තරමුල්ල

ගණන්දීමේ නිලධාරී
නම :
තනතුර :
දිනය :
මහාචාර්ය හරිස්චන්ද්‍ර අබේගුණවර්ධන
සභාපති
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
126, නාවල පාර, නුගේගොඩ

ගණකාධිකාරී
නම :
දිනය : 24/02/2021
එම්. ඩබ්ලිව්. ගයනි චාමලිකා
ගණකාධිකාරී (වැඩ බලන)
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
අංක. 126, නාවල පාර, නුගේගොඩ.

2

3.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-3

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන 2020 රු.	2019 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්		-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර		-
ලාභ		-
ආදායම් නොවන ලැබීම්	369,537	656,996
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්		
අග්‍රිම ලැබීම්	38,774,000	44,345,000
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	39,143,537	45,001,996
අඩුකළා : මුදල් වැය කිරීම		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	34,685,788	39,006,777
සහනාධාර සහ මාරුකිරීම්	3,124,710	762,736
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්		
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	116,182	638,728
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	37,926,680	40,408,241
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	1,216,857	4,593,755
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොලී	-	
ලාභාංශ	-	
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	
උප ණය අයකර ගැනීම්	-	
අත්තිකාරම් අයකර ගැනීම්	-	
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	
අඩුකළා : මුදල් වැය කිරීම		
භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම	1,119,582	4,553,885
අත්තිකාරම් ගෙවීම	104,000	
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	1,223,582	4,553,885
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(1,223,582)	(4,553,885)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	(6,725)	1,011,975
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	
විදේශීය ණය ගැනීම්	-	
ප්‍රදානයන් ලැබීම්	-	
තැන්පතු ලැබීම්	-	
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	
අඩුකළා : මුදල් වැය කිරීම		
දේශීය ණය ආපසු ගෙවීම්	-	
විදේශීය ණය ආපසු ගෙවීම්	-	
තැන්පතු ගෙවීම්	6,725	1,011,975
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	6,725	1,011,975
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	(6,725)	(1,011,975)
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)-(ඒ)	-	
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය		

3

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

2020 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3.6 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය - අදාළ නොවේ.

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන රු.		තත්‍ය වියදම රු.	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
පුනරාවර්ථන	**41,000,000**	**48,604,000**	**48,240,417**	**99**
මූලධන	**4,000,000**	**7,000,000**	**3,710,904**	**53**

3.8 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන (ප්‍රාග්ධන) - අදාළ නොවේ.

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය රු.,000 රු.	31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය රු.,000 රු.	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත රු.,000	ප්‍රගතිය %ලෙස වාර්තා කිරීම
9152	යන්ත්‍රෝපකරණ	**46,262,830**	**46,262,830**	**-**	**-**

3.10 විගණකාධිපතිගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/A/NEC/FA/2020 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2021 මැයි 21 දින

අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයෙන් දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2020 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්ථාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE

සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.1.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.49,523 ක් වූ ගෘහ භාණ්ඩ වටිනාකම වැරදීමකින් සන්නිවේදන උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව රු.45,018,493 ක් වූ ස්ථාවර වත්කම් ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ රු.45,156,061 ක් ලෙස දක්වා තිබූ අතර ඒ අනුව රු.137,568 ක වෙනසක් පැවතුණි.

1.6.2 තැන්පතු ගිණුම් ශේෂ

2020 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම පිළිබඳ ප්‍රකාශනයේ කොමිෂන් සභාවේ පොත් අනුව ශේෂය රු.2,450 ක් වූ අතර භාණ්ඩාගාර පොත් අනුව එම ශේෂය රු.32,450 ක් විය. ඒ අනුව රු.30,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශ

1.6.3 මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ තැන්පතු ලැබීම් රු.9,175 ක් ලෙස සටහන් විය යුතු වුවද මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ලෙස කිසිදු වටිනාකමක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සටහන් කර නොතිබුණි.

1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	ලේඛන වර්ගය	අදාළ රෙගුලාස	නිරීක්ෂණ
(අ)	බැඳීම් හා බැරකම් ලේඛනය	මුදල් රෙගුලාසි 214	පවත්වා නොතිබුණි.
(ආ)	පොදු තැන්පතු ලේඛනය	මුදල් රෙගුලාසි 571	යාවත්කාලීන කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

කොමිෂන් සභාවේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා වෙන්කළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය නොකරන ලද වැය විෂයන් 7 ට අදාළ ඉතිරිවීම් වටිනාකම රු.1,491,775 ක් වූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 100 දක්වා පරාසයක පවතින බව නිරීක්ෂණය විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

සමාලෝචිත වර්ෂයට අදාළ එකතුව රු.161,110 ක් වූ බැරකම් අයිතම 02 ක් බැරකම් පිළිබඳ ප්‍රකාශයේ සටහන් කර නොතිබුණි.

2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

නීතිරීති/ විධානයට යොමුව		විස්තරය
(අ)	මුදල් රෙගුලාසි 756 (6)	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදුකර එම වාර්තා 2021 මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද විගණන වාර්තාවේ දින වන විටත් අදාළ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

6 | Page

(ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3.1 වගන්තිය	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින්ම පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු නමුත් කොමිෂන් සභාව සතුව පවතින වාහන සඳහා ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.
(ඇ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	කොමිෂන් සභාවට අදාළව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 දැක්ම හා මෙහෙවර

කොමිෂන් සභාව විසින් 1992 වර්ෂයේ ඉදිරිපත් කළ අධ්‍යාපන ප්‍රතිපත්තිය සඳහා වූ යෝජනාවලිය පදනම් කරගෙන 1997 වර්ෂයේ ජනාධිපතිවරයා විසින් අධ්‍යාපන ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත්කර තිබුණ ද ඉන් පසුව ඉදිරිපත් කරන ලද අධ්‍යාපන ප්‍රතිපත්ති සඳහා යෝජනාවලින් ප්‍රතිපත්ති ලෙස ප්‍රකාශයට පත්කර නොතිබුණි.

3.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාළ වාර්ෂික කාර්යසාධන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3.2 ප්‍රසම්පාදනයන්

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පර්යේෂණ හා සංවර්ධන වැය විෂය (2507) යටතේ 2020 වර්ෂයට අදාළව පර්යේෂණ යෝජනා 05 ක් වෙනුවෙන් රු.600,000 ක් ගෙවීම් කර තිබුණද බාහිර පාර්ශවයෙන් නිපුණතා සහිත විශේෂඥයින් තෝරා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශයන් අනුගමනය කර නොතිබුණි. එසේම එම පර්යේෂණ යෝජනා සඳහා සමාලෝචන කමිටු අනුමැතිය 2021 පෙබරවාරි 10 දින ලබා දී තිබුණ ද එම අනුමැතියට පෙර එනම් 2020 දෙසැම්බර් 14 දින රු.120,000 බැගින් රු.600,000 ක් නිපුණතා සහිත විශේෂඥයින් වෙනුවෙන් ගෙවා තිබුණි.

3.3 බැඳීම් හා බැරකම්

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02 (අ) ඡේදයට අනුකූල නොවන පරිදි ඉතිරිවීම් ඉක්මවා රු.1,075,631 ක බැඳීම්වලට එළඹ තිබුණි.

4. තිරසාර සංවර්ධනය

4.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ආයතනය විසින් දැනුවත් වී, ආයතනයට අදාළ කර ගත හැකි තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු හඳුනා ගෙන තිබුණ ද එම ඉලක්ක ලඟා කර ගත යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ලඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය ප්‍රකාරව සියලුම අස්ථිත්‍යයන්හි අභ්‍යන්තර විගණනය සිදු කිරීම සඳහා එම අස්ථිත්‍යයේ පාලක මණ්ඩලය විසින් අභ්‍යන්තර විගණකයෙකු පත් කළ යුතු වුවද කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. එසේම රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය හරහා විගණන කටයුතු කිරීමට ඉල්ලීම් කර තිබුණ ද මේ දක්වා එම කටයුතු ක්‍රියාත්මක වී නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා සථ්‍ය කාර්ය මණ්ඩලය සඳහා වියදම්

කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 45 ක් වූ අතර සත්‍ය කාර්යමණ්ඩලය 34 ක් වුයෙන් තවදුරටත් පුරප්පාඩු 11 ක් පැවතුණි.

o/c

ඩබ්.එම්.පී.ඒ.ෆොන්සේකා
සහකාර විගණකාධිපති
විගණනකාධිපති වෙනුවට

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව. ශීර්ෂය 335		
අංකය	විගණන නිරීක්ෂණ	පිළිතුර
1.5	මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම	
1.5.1	මූල්‍ය තතත්වය පිළිබඳ ප්‍රකාශය	
1.5.1.1	මූල්‍ය නොවන වත්කම්	
	(අ)	මෙම වටිනාකම New Cigas මෘදුකාංගය හරහා නිවැරදිව ගිණුම් ගත කර ඇත. අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී සිදු වු දෝෂයක් හේතුවෙන් සන්නිවේදන උපකරණ යටතේ දක්වා ඇත.
	(ආ)	ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ වැය ශීර්ෂය 012 සිට 335 ලෙස (2020 සැප්තැම්බර් මස සිට) වෙනස් කරන ලදී. ඒ දක්වා ගිණුම්ගත ව තිබූ වත්කම් වල වටිනාකම වැය ශීර්ෂය 335 වෙත මාරු කර දෙන ලදී. එහෙත් සැප්තැම්බර් සිට දෙසැම්බර් 31 දක්වා මිල දී ගත් ස්ථාවර වත්කම් වල වටිනාකම වැය ශීර්ෂය 335 හි යාවත්කාලීන වී නොතිබුණි. එම අගයන් යාවත්කාලීන කරන ලද්දේ 2021 ජනවාරි මස දී වන අතර ඒ වන විට එම අගය භාණ්ඩාගාර මුද්‍රිත සටහන් හි වාර්තා වී නොතිබුනි.
1.5.2	තැන්පතු ගිණුම් ශේෂ	
	(අ)	කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව පොදු තැන්පතු ගිණුමේ ශේෂය රු. 32,450.00 ක් වන අතර ඊට අදාළ 2020.12.31 දිනට ශේෂ සැසඳුම් ප්‍රකාශයේ පිටපතක් ඇමුණුම් 1 මගින් දැක්වේ.
	(ආ)	අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී 2020 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂය රු. 30,000.00 ක් අතපසුවීමකින් වාර්තා නොවී ඇත.
	(ඇ)	භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව රු. 9175.00 ක් වූ 2020 වර්ෂය සඳහා වූ මුළු මාරු කිරීම් වල වටිනාකම රු. 9,175.00 කි. එය නිවැරදිව අවසන් ගිණුම් වල සඳහන් කර තිබේ. ඊට අදාල ශීර්ෂය 335 හි තැන්පතු ගිණුම් සාරාංශ පත්‍රය (ඇමුණුම 2) මේ සමග අමුණා එවමි.
1.5.3	මුදල් ප්‍රවාහ ප්‍රකාශය	
1.5.3.1	මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය	මෙම රු. 9,175.00 ක මුදල මෙම ආයතනය විසින් අයකරගනු ලබන මුද්දර ගාස්තු වලින් වන අතර මෙම මුදල් කාර්තුමය වශයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තු ගිණුමට බැර කරනු ලබයි. මෙය හරස් සටහන් මගින් සිදුකරනු ලබන ගණුදෙනුවකි.
1.5.4	ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම	
	(අ)	2021 වර්ෂයේ සිට බැදීම් හා බැරකම් ලේඛණය නිසි පරිදි යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත.
	(ආ)	2021 වර්ෂයේ සිට පොදු තැන්පතු ලේඛණය නිසි පරිදි යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත.
2	මූල්‍ය සමාලෝචනය	
2.1	වියදම් කළමනාකරණය	කෝවිඩ් වසංගත තත්වය හේතුවෙන් කාර්යාල කටයුතු අඛණ්ඩව නොපැවතීම හේතුවෙන් අවුරුද්ද සඳහාම වෙන් වී තිබූ වාර්ෂික පුනරාවර්තන ප්‍රතිපාදන ඉතිරි විය. ලේකම් ලෙස කටයුතු කරන ලද එච්. ජී. අප්සරා කල්දේරා මහත්මිය 2020.09.25 දින සිට ස්ථානමාරුවීම නිසා එම නිලධාරිනිය වෙනුවෙන් වෙන්කරගන්නා ලද ප්‍රවාහන දීමනාව ඉතිරි විය. (1401)

2.2	බැරකම් හා බැඳීම්වලට එළඹීම	2021 වසරේ සිට ඉදිරියට පවත්වාගෙන යාම සඳහා බැරකම් ලේඛණයක් ආරම්භ කර යාවත්කාලීන කර පවතින අතර විගණන විමසුමේ සඳහන් බැරකම් ප්‍රමාද දෝෂයක් මත බැරකම් පිළිබඳ ප්‍රකාශය I හි සඳහන් කිරීමට නොහැකි වී ඇත.
2.3	ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්	
	(අ)	කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවතින බවත් එම ක්‍රමවේදයන් කලින් කල සමාලෝචනය කෙරෙමින් අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලබන බවත් දන්වා සිටිමි. එකී සමාලෝචනයන් පිළිබඳව ලිඛිත ලේඛන පවත්වා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. ඉදිරියේදී එම ලේඛන විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.
	(ආ)	මෙම ආයතනය වෙනුවෙන් වෙනමම අභ්‍යන්තර විගණන ඒකකයක් පවත්වාගෙන යාම වෙනුවට එම අවශ්‍යතාවය රේඛීය අමාත්‍යාංශයේ විගණන අංශය හරහා සිදු කරවා ගැනීමට කටයුතු කරන ලෙස ලැබී ඇති උපදෙස් අනුව එය සිදු කර දෙන ලෙස ඉල්ලීමක් සිදු කර ඇත. පැවති අයහපත් සෞඛ්‍යය වාතාවරණය මත 2020 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට නොහැකි වී ඇත.
2.4	නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම	
	(අ)	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කරන ලදී. කෝවිඩ් වසංගත තත්වය හේතුවෙන් කාර්යාල කටයුතු අඛණ්ඩව නොපැවතීම හේතුවෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනතුරුව සිදු කළ යුතු වූ භාණ්ඩ අපහරණ කටයුතු සිදු කිරීමට නොහැකි විය. ඒ හේතුවෙන් අදාල වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත.
	(ආ)	කොමිෂන් සභාවේ වාහනවල ඉන්ධන දහනයේ අසාමාන්‍ය වෙනසක් නොපැවතීම හේතුවෙන් ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාව සිදු නොකරන ලද අතර ඉදිරියේ දී එම පරීක්ෂාවන් කාලානුරූපීව සිදු කිරීමට උපදෙස් ලබා දී ඇත.
	(ඇ)	කොමිෂන් සභාවට අදාලව මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීමට කටයුතු සිදු කෙරෙමින් පවතී.
2.5	බැංකු ගිණුම් මෙහෙයවීම	වලංගු කාලය අවසන් ව ඇති චෙක්පත් සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව අවශ්‍ය කටයුතු සිදු කර ඇත.
3	මෙහෙයුම් සමාලෝචනය	
3.1	කාර්ය සාධනය	
3.1.1	දැක්ම හා මෙහෙවර	මෙම කොමිෂන් සභාවේ කාර්යය වනුයේ ප්‍රතිපත්ති යෝජනා සකස් කර ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම පමණක් වන අතර එය ප්‍රතිපත්තියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සිදු කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසින් වේ.
3.1.2	වාර්ෂික කාර්යසාධන වාර්තාව	2020 වර්ෂයට අදාල වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කෙරෙමින් පවතී.
3.2	ප්‍රසම්පාදනයන්	අදාල පර්යේෂණ යෝජනා සඳහා සමාලෝචන කමිටුවේ නිර්දේශය අනුව සභාපතිවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව මෙම පර්යේෂණ යෝජනා පිළියෙල කිරීමේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති ගෙවීම සිදු කරනු ලැබේ. පර්යේෂණ යෝජනා සඳහා සමාලෝචන කමිටු රැස්වීම පැවැත්වීමට දිනයක් යොදා ගැනීමට නොහැකි වීම මත එම කමිටුවේ නිර්දේශයන්ට අනුකූල වන අයුරින් සංශෝධන සිදු කිරීමට එකගවන පදනම යටතේ ගෙවීම් සිදු කිරීමට සභාපතිතුමාගේ අනුමැතිය ලබා ගෙන ඇත.
3.3	බැදීම් හා බැරකම්	දෛනිකව රාජකාරි කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම උදෙසා විගණන විමසුමේ සඳහන් වැය විෂයයන්හි ප්‍රතිපාදන ඉක්මවා බැඳීම්වලට එළඹීමට සිදු වී ඇත. 2017.04.25 දිනැති අංක 255/2017 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 02 (ආ) ඡේදයට අනුව ඉදිරියේදී වියදම් කළමනාකරණය කරගැනීමට කටයුතු කරමි.
4.	තිරසාර සංවර්ධනය	
4.1	තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම	තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක ලබා කර ගැනීම මැන බැලීම සඳහා වන නිර්ණායක අදාල වන්නේ මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලබන ආයතන විසින් වන හෙයින් මෙම ආයතනය ඒ සම්බන්ධයෙන් දර්ශක හඳුනාගැනීම අවශ්‍ය

		නොවන බව නිරීක්ෂණය කරමි. ප්‍රතිපත්ති සම්පාදන කාර්යයන් හිදී මෙම අරමුණු පිළිබඳව අවධානය යොමු කරන බව වැඩිදුරටත් සඳහන් කරමි.
5	යහපාලනය	
5.1	අභ්‍යන්තර විගණනය	කොමිෂන් සභාව සඳහා වෙනමම අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපනය කිරීම වෙනුවට අදාල කාර්යය රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය හරහා විගණනයක් සිදු කරවා ගැනීමට ඉල්ලීමක් සිදු කර ඇත.
6	මානව සම්පත් කළමනාකරණය	
6.1	අනුයුක්ත කාර්ය මණ්ඩල හා තථ්‍ය කාර්ය මණ්ඩලය සඳහා වියදම්	
	(අ)	කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 45 කි. විගණන දිනට පැවති පුරප්පාඩු සංඛ්‍යාව 20 කි. ඉන් තනතුරු පුරප්පාඩු 09 ක් සඳහා බඳවාගැනීම් සිදුකර ඇත. ඉතිරි තනතුරු සඳහා ඉදිරියේ දී බඳවා ගැනීම් සිදු කිරීමට සැලසුම් කරමින් පවතී.
	(ආ)	මෙම අධ්‍යයන තනතුරු පුරප්පාඩු සියල්ල සඳහා මේ වනවිට බඳවා ගැනීම් සිදුකර අවසන් ව ඇත.

පරිච්ඡේදය 04 - කාර්ය සාධක දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධක දර්ශක

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100%-90%	**75%-89%**	**50%-74%**	**50%** අඩු
	අදාළ නොවේ			

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීම

5.1 තිරසාර සංවර්ධන අරමුණු

සැමට එක හා සමාන ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා ජීවිත කාලය පුරාම ඉගෙනීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

5.2 තිරසාර සංවර්ධන අරමුණු වල ජයග්‍රහණ සහ අභියෝග

අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ක්‍රියාවලියේදී අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක (එස්ඩීජී) සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අවශ්‍ය පියවර ගෙන ඇත. ඒ අනුව, ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව 2020-2030 වාර්තාව පිළියෙල කිරීමේ කාර්යය 2020 ජූලි මස ආරම්භ කරන ලද අතර තිරසාර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම පාදක කරගත් ප්‍රතිපත්තිමය නිර්දේශ, මෙම වාර්තාව තුළ අන්තර්ගත කිරීමට සැලසුම් කර ඇත.

ඉලක්කය : අන්තර්කරණ සහ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට යාවජීව ඉගෙනීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

5.2.1 වර්ෂ 2030 වන විට, සියලුම ගැහැනු ළමයින් හා පිරිමි ළමයින් අදාළ සහ ඵලදායී ඉගෙනුම් ඵල කරා ගෙන යන සාධාරණ හා ගුණාත්මක ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කරන බව සහතික කිරීම.

5.2.2 වර්ෂ 2030 වන විට සියලුම ගැහැණු ළමයින්ට හා පිරිමි ළමයින්ට ගුණාත්මක මුල් ළමාවිය සංවර්ධනය, රැකවරණය සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ප්‍රවේශය ඇති බවට සහතික කිරීම සහ එමගින් ඔවුන් ප්‍රාථමික අධ්‍යාපනයට සූදානම් කරවීම.

5.2.3 වර්ෂ 2030 වන විට, විශ්වවිද්‍යාලය ඇතුළු දැරිය හැකි සහ ගුණාත්මක තාක්ෂණික, වෘත්තීය හා තෘතීයික අධ්‍යාපනය සඳහා සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට සමාන ප්‍රවේශයක් සහතික කිරීම .

5.2.4 වර්ෂ 2030 වන විට රැකියා සහ ව්‍යවසායකත්වය සඳහා අවශ්‍ය තාක්ෂණික හා වෘත්තීය කුසලතා ඇතුළුව අදාළ කුසලතා ඇති තරුණ හා වැඩිහිටියන්ගේ සංඛ්‍යාවේ සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබෙනු ඇත.

5.2.5 වර්ෂ 2030 වන විට, ආබාධිත පුද්ගලයින්, ආදිවාසීන් සහ අවදානමට ලක්විය හැකි අවස්ථාවන්හි සිටින ළමුන් ඇතුළුව අවදානමට ලක් වූවන් සඳහා අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ විෂමතා තුරන් කිරීම සහ සියලු මට්ටමේ අධ්‍යාපන හා වෘත්තීය පුහුණුව සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම

5.2.6 වර්ෂ 2030 වන විට, පුරුෂයින් හා ස්ත්‍රීන් යන දෙපාර්ශවයේම සියලුම තරුණ තරුණියන් සහ වැඩිහිටියන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් සාක්ෂරතාව සහ ගණිත හැකියාව ලබා ගැනීම තහවුරු කිරීම.

5.2.7 වර්ෂ 2030 වන විට, තිරසාර සංවර්ධනය සඳහා අධ්‍යාපනය සහ තිරසාර ජීවන රටාවන්, මානව හිමිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව, සාමය හා අවිහිංසාවාදී සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය අගය කිරීම සහ තිරසාර සංවර්ධනය සඳහා සංස්කෘතියේ දායකත්වය අතුරින් තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතා සියලු ඉගෙනුම්කරුවන් විසින් ලබා ගැනීම තහවුරු කිරීම.

පරිච්ඡේදය 6 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	12	03	09
තෘතියික	11	04	07
ද්විතියික	10	07	03
ප්‍රාථමික	12	10	02

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිගය හෝ අතිරික්තයේ බලපෑම - අදාළ නොවේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

2020 වර්ෂයේ දී පැවති කොවිඩ් 19 කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට නොහැකි විය.

පර්ච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)		අදාල නොවේ	අදාල නොවේ
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්		අදාල නොවේ	අදාල නොවේ
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.6	වෙනත්	කිසිවක් නැත	කිසිවක් නැත	කිසිවක් නැත
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		

3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැත් අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම		අභ්‍යන්තර විගණන අංශයක් නොපැවතීම	මේ සඳහා අවශ්‍ය සහය අනෙක් දෙපාර්තමේන්තු වලින් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134(2)DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම		අභ්‍යන්තර විගණන අංශයක් නොමැත.	මේ සඳහා අවශ්‍ය සහය අනෙක් දෙපාර්තමේන්තු වලින් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුල දී පිළිතුරු සපයා තිබීම		අදාළ නොවේ.	
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම		අදාළ නොවේ.	
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම		අදාළ නොවේ.	
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම		කොවිඩ් 19 ගැටලු හේතුවෙන් සිදු කිරීමට නොහැකි විය.	
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණ කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල නොවේ.	කොවිඩ් 19 ගැටලු හේතුවෙන් සිදු කිරීමට නොහැකි විය.	
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල නොවේ.	කොවිඩ් 19 ගැටලු හේතුවෙන් සිදු කිරීමට නොහැකි විය.	
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම		තොරතුරු ඉල්ලා සිටි අවස්ථාවන්හි අදාල තොරතුරු ඉදිරිපත් කර ඇත.	මාසිකව අදාල තොරතුරු විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත.
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල නොවේ.		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ.		

12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිගහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිගහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ.		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ.		
15.3	මු.රෙ. 176 අනුව හිග ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
17	මහජනයා වෙත තොරතුරු ලබා දීම			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර , වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.		

17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම		අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී	අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම		අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී	අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම		අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී	අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම		කොවිඩ් 19 නිසා සාර්ථකව සිදු කිරීමට නොහැකි විය.	
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම		අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී	අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම		අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී	අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		

වයි.ආර්. හේවාසිලියනේග්
වැඩබලන වැඩසටහන් නිලධාරී (මූල්‍ය)
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව